# නෝර්වේ ආපසු ගියහොත්

නෝර්වේ රාජ්‍යය යනු කොටි සංවිධානයට පක්ෂ වූ ද, සිංහලයන්ට විරුද්ධ වූ ද රාජ්‍යයක් ය යන්න අද වුවමනාවටත් වඩා තහවුරු වී ඇත. එහෙත් අවුරුදු දහයකට එකොළහකට පමණ පෙර අප නෝර්වේ තානාපති කාර්යාලය ඉදිරිපිට පිකට්ටුවක් සංවිධානය කළ අවස්ථාවේ දී එයට සහභාගි වූයේ තිස්පස්දෙනකුට ද අඩු සංඛ්‍යාවකි. ඒ සංඛ්‍යාව හරියට ම එකල එක්තරා රූපවාහිනී නාලිකාවකින් ප්‍රකාශකෙරුණේ අපට ඔච්චම් කරන ආකාරයකිනි. පිකට්ටුවට සහභාගි වූ පිරිස අඩුවූයේ සමහරවිට අපේ සංවිධාන ශක්තියේ දුර්වලකම හේතුකොටගෙන විය හැකි ය. එසේත් නැතහොත් නෝර්වේ ගැන ජනතාව නිසි අවබෝධයකින් යුක්ත නොවීම නිසා විය හැකි ය. නැතහොත් ඒ කරුණු දෙකම නිසා අපේ පිකට්ටුවට සහභාගි වූ ප්‍රමාණය අඩුවූවා විය හැකි ය. එදා අප කීවේ නෝර්වේ රාජ්‍යය කොටින්ට ආධාරකරන බව ය. කොටි සංවිධානයට අඩුම තරමින් සහසන්ධීය රාජ්‍යයක් ලබාදීමට නෝරාවේ රාජ්‍යය ක්‍රියාකරන බව අපි කීවෙමු. එදා අප කී බොහෝ දේ සත්‍ය බව අද ජනතාවට වැටහීම පිළිබඳ අපි සතුටු වෙමු. නෝර්වේ රාජ්‍යය වෙනුවෙන් ඊනියා පහසුකම් සැපයීමේ කටයුත්තට මෙහි පැමිණි සොල්හයිම් හා වෙනත් අය ජනතාවට පහසුවෙන් ම තමන් තේරුම්ගැනීමට හැකිවන අයුරින් කටයුතු කළහ. ඔවුහු එතරම් දක්ෂ නියෝජිතයන් නොවන බව කල්ක්‍රියාවෙන් ම දැනගැනීමට සැලැස්වූහ. මේ අදක්ෂයන් දක්ෂයන් බවට පත්කරනු ලැබුයේ මෙරට රාජ්‍ය නොවන සංවිධාන, ඇතැම් ජනමාධ්‍ය හා රනිල් චන්ද්‍රිකා යුවළ විසින් ය. රටේ ස්වෛරීභාවය පාවාදීමට කටයුතුකළ මොවුහු තම නිවටකම හා බටහිර අධිරාජ්‍යගැතිකම හැකි සෑම අවස්ථාවක ම හෙළිදරව්කරමින් අර අදක්ෂයන් කියන කරන දේ ඒ අයුරින් ම ඉටුකළහ. එමගින් අදක්ෂයන් දක්ෂයන් ය යන හැඟීමක් ජනතාවට දෙනු ලැබිණි.

අද නෝර්වේ නියෝජිතයන් ආපසු යන ලකුණු සෑම අතකින් ම පළ වී ඇත. මහින්ද රාජපක්ෂ මහතා ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවට හිස නොනමා කටයුතු කරගෙන යයි. එතුමාට කියුබාවේ ද ෆිඩෙල් කස්ත්‍රෝ මහතාගෙන් වටිනා ආදර්ශයක් ද ලැබෙන්නට ඇත. අද ලෝකයේ එකම සුපිරි බලවතා ඇමරිකා එක්සත් ජනපදය ය. එවැනි බලවත් රටක් අසල පිහිටි කුඩා රටක් වුව ද කියුබාවට තම ස්වෛරීභාවය රැකගැනීමට හැකි වී ඇත. මෙරට සිටින රාජ්‍ය නොවන සංවිධානවල බත්බැළයන්ට, සිංහල බෞද්ධ විරෝධී රාවයක් නංවන කසිකබල් පුවත්පත් හා මහරාජලාට අනුව නම් ඊනියා කුඩා රාජ්‍ය අසල්වැසි බලවතුන්ට විරුද්ධව නොයා යුතු ය. එසේ විරුද්ධවීම සියදිවි නසාගැනීමක් යැයි ඔවුහු කියති. ඔවුන් කුමක් කීවත් අපේ ස්වෛරිභාවය, රැකෙන්නේ ඊනියා ජාත්‍යන්තරය හමුවේ හිස නොනමා සිටීමෙනි. මහින්ද රාජපක්ෂ මහතා දැනට ඒ කාර්යය ඉතා සාර්ථකව කරයි. එය එසේ ම දිගින් දිගට ම පවත්වාගෙන යෑමට ජනතාවගේ සහය අවශ්‍ය වෙයි. කස්ත්‍රෝ මහතාට ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යයට හිස නොනමා සිටීමට එකල පැවති සෝවියට් දේශය යම් ප්‍රමාණයකට උපකාරි වූවා නිසැක ය. එහෙත් සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසුව වුව ද තම ස්වාධීනත්වය දිගට ම පවත්වාගෙන යෑමට කස්ත්‍රෝ මහතාට හැකි විය. එයට ප්‍රධාන හේතුවක් වූයේ කියුබානු ජනතාව තම නායකයා සමග සිටීම ය. ඒ සහාය දීමේ දී ජනතාව කස්ත්‍රෝ මහතාගේ ගුණාංග ද සලකන්නට ඇත. අද අප රටේ ද ජනාධිපතිතුමා හා ජනතාව අතර එවැනි සම්බන්ධයක් අවශ්‍ය වෙයි. මහින්ද රාජපක්ෂ මහතා රට වෙනුවෙන් කැප වී සිටින බව ජනතාවට ඒත්තු ගිය යුතු අතර ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් ඒ මහතා පෙනී සිටීම අනිවාර්ය වෙයි. මෙරට සම්ප්‍රදාය අනුව භික්ෂූන් වහන්සේ ද මේ කාර්යයේ දී වැදගත් වෙයි. උන්වහන්සේලාගේ අනුශාසනා රාජපක්ෂ මහතාට මෙන් ම ජනතාවට ද අවශ්‍ය වෙයි. භික්ෂූන් වහන්සේ, ජනාධිපති, ජනතාව යන ත්‍රිකෝණය ශක්තිමත් වූ විට මෙරට ස්වෛරීභාවය ආරක්ෂාකිරීම යන ප්‍රශ්නය බොහෝ දුරට විසඳෙනු ඇත.

නෝර්වේ රාජ්‍යය ඊනියා පහසුකම් සපයන්නාගේ කාර්යයෙන් මුදාහරිනු ලැබුවහොත් ඒ වෙනුවට පත්වන්නේ කවු ද යන ප්‍රශ්නය පැනනගියි. අපට තවදුරටත් ඊනියා පහසුකම් සපයන්නකු අවශ්‍ය ද යන මූලික ප්‍රශ්නය මෙහි දී නැගියහැකි ය. පහසුකම් සපයන්නකු අවශ්‍ය ඊනියා සාම සාකච්ඡා පැවැත්වීමට ය. ඒ සාම සාකච්ඡා පවත්වන්නේ කා සමග ද? ඒ හුදෙක් කොටි සංවිධානය සමග පමණක් ද? අද දේශපාලන තත්වය දැනට අවුරුදු දහයකට පෙර පැවති තත්වයට වඩා වෙනස් ය. අද කරුණා කොටි සංවිධානයෙන් කැඩී ඇත. නැගෙනහිර පළාතේ කොටි ශක්තිය අද ඉතාම දුර්වල වෙයි. කොටි අද උතුරු පළාතේ ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වී ඇතැයි කිවහොත් නිවැරදි ය. ඊනියා මායිම් ගම්මාන සංකල්පය මෙරට වලංගු නැත. මුස්ලිම් ජනයා ද තමන් ඊනියා සාම සාකච්ඡාවල

© Prof. Nalin De Silva

පාර්ශ්වකරුවකු විය යුතු යැයි කියා සිටිති. කරුණා ද කියන්නේ තමන් ඊනියා සාකච්ඡාවල නියෝජිතයකු විය යුතු බව ය. අපට ඇසිය හැකි හා ඇසිය යුතු ප්‍රශ්නය නම් ඊනියා සාම සාකච්ඡාවල සිංහලයන් නියෝජනය නොවිය යුතු ද යන්න ය. ආණ්ඩුව සිංහලයන් නියෝජනය නො කරයි. ආණ්ඩුව සිංහල ආණ්ඩුවක් ලෙස හංවඩු ගසනු ලැබුයේ බටහිර ජනමාධ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල බත්බැළයන් විසිනි. එහෙත් කිසිම ආණ්ඩුවක් සිංහල ආණ්ඩුවක් නො වේ. චන්ද්‍රිකා කුමාරතුංග රනිල් වික්‍රමසිංහ නායකත්වය දැරූ ආණ්ඩු සිංහල ආණ්ඩු යැයි කිවහැක්කේ කලින් කියන ලද බත්බැළයන්ට පමණකි. මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව වුව ද සිංහල ආණ්ඩුවක් නො වේ. එහි ඩග්ලස් දේවානන්ද මහතා පමණක් නොව තොණ්ඩමන් චන්ද්‍රසේකරන් ආදීහු ද වෙති. එහි ෆේරියල් අශ්රොෆ් මහත්මිය ද වෙනත් අය ද වෙති. එසේ නම් ඊනියා සාම සාකච්ඡාවල දී ආණ්ඩුවට සිංහලයන් නියෝජනය කළ නො හැකි ය. ඊනියා සාම සාකච්ඡා පවත්වන්නේ නම් එයට සිංහලයන් ද සෘජුව හවුල්කරගත යුතු ය. මෙවැනි තත්වයක් පසුබිම් කරගෙන ඊනියා සාම සාකච්ඡා යන සංකල්පය තව දුරටත් වලංගු වේ ද? එබැවින් ඊනියා පහසුකම් සපයන්නකු අපට තවදුරටත් අවශ්‍ය වන්නේ ද?

නෝර්වේ වෙනුවට බ්‍රිතානිය පහසුකම් සපයන්නා ලෙස පත්කිරීමේ අවශ්‍යතාවක් නැත. බ්‍රිතානිය යනු මෙරට ප්‍රශ්නය බෞතීස්ම කළ රට ය. මෙරට බ්‍රිතානි මහාකොමසාරිස්වරයාට ඊනියා ප්‍රශ්නයට තමන්ගේ ම වූ විසඳුමක් ඇත. ඔහු පසුගිය දා කියා තිබුණේ අයර්ලන්තයේ මෙන් බලය විමධ්‍යගත කළයුතු බව ය. මෙරට ප්‍රශ්නය අයර්ලන්ත ප්‍රශ්නයෙන් ඉඳුරාම වෙනස් ය. එහි එකම සමානකම ඇත්තේ ප්‍රශ්න දෙකම ඇති කෙළේ බ්‍රිතානිය වීමෙහි ය. බ්‍රිතානිය අයර්ලන්තය යටත්කර ගත්තේ ය. අද බ්‍රිතානියට ඇත්තේ අයර්ලන්තයට පූර්ණ නිදහස දීම මිස ඊනියා බලය නො වේ. එහෙත් මෙරට තත්වය වෙනස් ය. මෙරට කිසි දිනක ස්වාධීන දෙමළ රාජ්‍යයක් තිබී නැත. ඊනියා සුළුජාතීන් ඇතිකර ප්‍රශ්නය නිර්මාණයකළෝ බ්‍රිතානිහු ය. ඔවුන් ඇතිකළ ප්‍රශ්නය විසඳීමට ඔවුන්ගේ ආධාර අවශ්‍ය නැත. අද ආණ්ඩුව කළ යුත්තේ ඉතා සාර්ථකව ප්‍රතිප්‍රහාර පමණක් එල්ලකරන යුද හමුදාව තව තවත් ධෛර්යමත්කිරීම ය. ජනතාව ද හමුදාව අගයකිරීමේ හමුදාවට සෙත්පැතීමේ කාර්යයනට දැනටත් වඩා සහභාගිවිය යුතු ය. හමුදාව ඊනියා ප්‍රතිප්‍රහාර හෙවත් සීමිත මෙහෙයුම්වලට පමණක් සීමාවීමේ අවශ්‍යතාවක් නැත. කොටි කඳවුරු තිබෙනතාක් ඒ යොදාගන්නේ හමුදාවට පහරදීමට බව අමතක නොකළ යුතු ය. අද කළ යුත්තේ පහර දුන්නොත් ප්‍රතිප්‍රහාරයක් එල්ලකිරීම පමණක් නොව, පහරදීම් වැළැක්වීමට කටයුතුකිරීම ය. රෝගවලට ප්‍රතිකාරයට වඩා රෝග වැළැක්වීම වැදගත් යැයි කතාවක් ඇත. එපරිදි ම ආණ්ඩුව කළ යුත්තේ කොටි කඳවුරු සොය සොයා ගොස් පහරදීමට හමුදාව මෙහෙයවීම ය. එයට හමුදාව සූදානම් පමණක් නොව ඒ සඳහා හමුදාවට ශක්තිය ද නොඅඩුව ම ඇත. කළ යුත්තේ අණ දීම පමණකි.

එසේ නම් ප්‍රශ්නය විසඳීම සඳහා කුමක් කළයුතු දැයි රාජ්‍ය නොවන බත්බැළයන් අපෙන් ඇසීමට ඉඩ ඇත. ප්‍රශ්නය විසඳීම සඳහා ගතයුතු එක් පියවරක් නම් මේ බත්බැළයන්ට මුදල් ලැබෙන මාර්ග අවහිරකිරීම ය. රාජ්‍ය නොවන සංවිධානවල ඇත්තේ කුලීකාර හමුදාවක් යැයි පසුගියදා ප්‍රකාශවිණි. සමස්තයක් ලෙස ගත්කල අද මෙරට රාජ්‍ය නොවන සංවිධාන, විදේශීය ආධාර ලබන නාට්‍යකරුවෝ සිනමාකරුවෝ ආදීහු අද පවතින සටනේ දී සිවිල් හමුදාවක කාර්යභාරය ඉටුකරති. සිවිල් හමුදාව යන වචනය ම වැරදි යැයි බක පණ්ඩිතයකු කීමට ඉඩ ඇත. එහෙත් මේ බැළයන් හැඳින්වීමට වෙනත් වචනයක් නැත. ඔවුහු සිවිල් වේශයෙන් හිඳිමින් කොටින්ට ආධාරකරති. මේ බැළයන්ගෙන් සමහරු උතුරට යෑමට ඔවුන්ට ඇති ඊනියා අයිතියක් වෙනුවෙන් මේ දිනවල කෑමොර ගසති. මොවුන්ට උතුරට යෑමට හැකි වී තිබෙන්නේ ම කොටින්ගේ ආරක්ෂාව හා සහය ඔවුන්ට ලැබෙන බැවිනි. රාජ්‍යයේ ස්වෛරීභාවයට තර්ජනයක් වී ඇති මොහොතක ඊනියා පුද්ගල භාෂණ නිදහස, චලනය වීමේ (ඇවිදීමේ) නිදහස ආදී සංකල්පවල වලංගුභාවයක් නැත. සැප්තැම්බර් එකොළොස සිද්ධියෙන් පසු ඇමරිකාවේ ජනමාධ්‍ය ක්‍රියා කෙළේ කෙසේ ද? ඔවුන් පෙංටගනය විවේචනයකරමින් රට වටේ සම්මන්ත්‍රණ පැවැත්වූ බවක් අසන්නට නැත. එරට ජනමාධ්‍ය තමන් විසින් ම රටේ ආරක්ෂව වෙනුවෙන් ස්වයං වාරණයක් පණවා ගනු ලැබිණි. එහෙත් මෙරට බත්බැළයෝ එසේ නොකරති. ඔවුහු ඊනියා යුද විරෝධී රැළි පවත්වති. ප්‍රශ්නය විසඳීම සඳහා ගතයුතු වැදගත් ම පියවර ප්‍රශ්නය හඳුනාගැනීමට කටයුතුකිරීම ය. අප විසින් අවුරුදු දොළහකට පමණ පෙර ප්‍රභාකරන්, ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා කෘතිය පළකරන ලද්දේ ද ප්‍රශ්නය හඳුනාගැනීමට ය. එදා මෙදා තුර එහි ඇති අදහස් වර්ධනය කෙරී ඇති අතර නව අදහස් ද එකතුකෙරී ඇත. මෙරට ඇති ප්‍රශ්නය අපි අද එක් වාක්‍යයකින් කියමු. ඒ සිංහලත්වයට

© Prof. Nalin De Silva

මෙරට හිමි තැන අහිමි කිරීම ය. විසඳුමක් සොයාගත්තේ ඒ ප්‍රශ්නට මිස දෙමළ ජනයාට වී ඇතැයි බියන ඊනියා අසාධාරණවලට නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva